Department of Education and Early Childhood Development

Literacy tips to help your child
Year 3–6
Sinhalese


# ඔබේ ළමයාට උදව් කිරීම සඳහා සාක්ෂරතා හෝඩුවාවල්

වසර 3-6

## සෑම ළමයෙක්ටම, සෑම අවස්ථාවක්ම










පවුල් විසින් ළමයෙකුගේ වර්ධනය කෙරෙහි ප්‍රථම සහ වඩාත් කල් පවත්නා බලපෑමක් ඇති කරනු ලබන අතර ළමයාගේ ඉගෙනීම කෙරෙහි වැදගත් කාර්යභාරයක් ද ඉටු කරනු ලැබේ.

ක්‍රීඩා කිරීම සහ එදිනෙදා පවුලේ ක්‍රියාකාරකම් තුළින් තම ළමයාගේ කථනයේ, සවන් දීමේ, කියවීමේ සහ ලිවීමේ කුසලතා බොහෝ අයුරින් වර්ධනය කිරීමටත්, ඊට උදව් කිරීමටත් ඔබට විවිධ මාර්ග ඇත.

ඔබ හෝ අනෙකුත් පවුලේ සාමාජිකයන් විසින් එදිනෙදා ක්‍රියාකාරකම් තුළින් ඔබේ ළමයාගේ සාක්ෂරතා හැකියාවන් වර්ධනය උදෙසා කළහැකි දේවල් ගැන මෙම පත්‍රිකාවෙන් හෝඩුවාවල් සපයනු ලැබේ.

ඔබේ ළමයාගේ පළමු භාෂාවෙන් සහ, ඔබට විශ්වාසයක් තිබේ නම් ඉංග්‍රීසියෙන්ද ළමයා මෙම ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කර ගැනීම ඉතා ඵලදායක වියහැකිය.

මෙම පත්‍රිකාවේ විද්‍යුත් සංස්කරණ ඉංග්‍රීසි සහ වෙනත් භාෂා 23කින් Families as Partners in Learning වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: **www.education.vic.gov.au/about/directions/familiesaspartners/schools/connecting.htm**

## මට උදව් ලබාගත හැක්කේ කොතැනින්ද? ඔබේ ළමයාගේ ගුරුවරයාගෙන්

ඔබේ ළමයාගේ සාක්ෂරතා හැකියාවන් වර්ධනය උදෙසා ඔබට උදව් කළහැකි අයුරු ගැන උපදෙස් ඔබේ ළමයාගේ ගුරුවරයාට ඔබට සැපයිය හැකිය. ගුරුවරයා සමග ඔබට සාකච්ඡා කළහැකි මාතෘකා සමහරක්:

- සාක්ෂරතා කාර්යයන් හිදී ඔබේ ළමයාගේ සාධන මට්ටම.
- ඔබේ ළමයා ළඟාවීමට ක්‍රියාකරන සාක්ෂරතා ඉලක්ක, සහ ඔබේ ළමයාට එම ඉලක්ක වලට ළඟාවීමට ඔබ විසින් උපකාර කළහැකි අන්දම.
- ඔබේ ළමයා මුහුනපාන දුෂ්කරතා අංශයන්හිදී ඔහුට හෝ ඇයට උපකාර කිරීමට ඔබ විසින් භාවිතා කළහැකි උපක්‍රම.

## මාර්ගගත සම්පත්

වික්ටෝරියානු රජයේ නව *Connect-Primary* වෙබ් අඩවිය මගින් ඔබේ නිවසේ පරිගණකය, ඔබේ ප්‍රදේශයේ පුස්තකාලයේ පරිගණකය හෝ පාසැල ඔස්සේ වැදගත් ඉගෙනුම් මෙවලම් (learning tools) හා සම්බන්ධවීමට පහසු කරයි.

*Connect-Primary* වෙබ් අඩවියට මෙතැනින් පිවිසෙන්න: **http://www.education.vic.gov.au/primary**

*Connect-Primary* හි අන්තර්ගත අඩවි ළමයින්ගේ භාවිතය සඳහා උචිත බව තහවුරු කිරීම සඳහා ගුරුවරුන් විසින් පිරික්සා බලා සහතික කර ඇත.

මතක තබාගන්න: *Connect-Primary* වෙබ් අඩවියෙහි අඩංගුකර නැති වෙනත් වෙබ් අඩවිවලට ඔබ පිවිසෙන්නෙහිනම්, ඔබේ ආරක්ෂාව සඳහා, ඔබේ නම, ඔබේ ළමයාගේ සම්පූර්ණ නම, පාසැල, දුරකතන අංකය හෝ ලිපිනය වැනි පුද්ගලික තොරතුරු ඔබ නොදන්නා කිසිම පුද්ගලයකුට මාර්ගගතව කිසිම විටක නොදිය යුතුය.

*Ultranet* යනු පාසැලේදී ඔබේ ළමයාගේ ඉගෙනීම ගැන තොරතුරු ඔබට සපයන නව මාර්ගගත පද්ධතියකි. එය සිසුන්ට, දෙමාපියන්ට සහ ගුරුවරුන්ට අන්තර්ජාලය හරහා පිවිසිය හැකි ප්‍රාන්තය පුරා විහිදෙන, සුරක්ෂිත වෙබ් අඩවියකි. *Ultranet* වෙබ් අඩවියට මෙතැනින් පිවිසෙන්න: **www.education.vic.gov.au/about/directions/ultranet/benefits/parents.htm**

# ඔබේ ළමයාට කියවීමට, ලිවීමට සහ බැලීමට උදව් කිරීම

## නිවසේදී කියවීමට සහ ලිවීමට අවස්ථා උදාකරන්න:

ළමුන්, කියවන්නන් සහ ලියන්නන් හැටියට නිවසෙන් සහ පාසැලෙන් ඔබ්බෙහි ඇති ඔවුන්ගේ ලෝකය සැමදා ගවේෂණය කරති.



ඔබ මේ දේවල් වැදගත්කොට සළකන්න:

- ඔබේ ළමයා කියවන, ලියන, සහ බලන සෑම වර්ගයකම ලේඛන ගැන සැබෑ උනන්දුවක් පෙන්වන්න.
- ඔබ කියවීමේ සහ ලිවීමේ යෙදෙන අයුරු ඔවුන්ට දකින්නට ඉඩ සලසන්න, ඔබ කියවන්නේ සහ ලියන්නේ මන්ද යන්න ඔවුනට පවසන්න.
- ඔවුන්ගේ අවබෝධය ගැන ඔබේ ළමයා සමග කතා කරන්න, ඔවුන්ගේ කියවීමේ සහ ලිවීමේ ප්‍රයත්නයන් දිරිගන්වන්න.
- පවුලේ ඉතිහාස සහ කතන්දර ගැන කතා කිරීමට ළමයා හවුල් කර ගන්න, පවුලේ වැඩිහිටි සාමාජිකයන් සමග කතා කිරීමට ඔබේ ළමයාට දිරිදෙන්න.
- ඔබ එකට නැරඹූ රූපවාහිනී දර්ශන සහ චිත්‍රපට ගැන සාකච්ඡා කරන්න.
- තමන්ගේම පොත් ඇතුලත් පුස්තකාලයක් ගොඩනගා ගැනීමට ඔබේ ළමයාට දිරිදෙන්න.
- ලෝක සිදුවීම් ගැන කතා කරන්න, සිද්ධියේ වෙනත් වෙනත් පැති දෙස බලා තමන්ගේම මතයන් ගොඩනගා ගැනීමට ඔබේ ළමයාට දිරිදෙන්න.

## නිවසේදී ඔබේ ළමයාගේ කියවීමට සහ ලිවීමට උදව් කිරීම

### ඉගෙනීම සඳහා චර්යා



රටාවක් නිර්මානය කරන්න, ලිවීමට පෙළඹවීම සඳහා ඊට අවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙන්න:

- ඔවුන්ගේ අදහස් සහ හැඟීම් ලිවීමට සටහන් පොත්.
- පරිගණක සහ/හෝ නෙට්බුක් පරිගණක (netbooks).
- ලකුණු කිරීමේ පෑන් (Markers), පැන්සල්, මතුකර දක්වන පෑන් (highlighters) සහ පෑන්.
- නිර්දේශනය සඳහා ශබ්ද කෝෂ සහ වාච්‍ය කෝෂ (thesauruses). මෙම පොත් මාර්ගගතව (online) සොයාගත හැක.
- මාර්ගගත සිතියම්, විශ්ව කෝෂ, කාලගුණ වෙබ් අඩවි වැනි මාර්ගගත මූලාශ්‍ර (Online resources).

ලේඛන පිළිබඳව අදහස් හුවමාරු කරගන්න.

ඔබේ ළමයා ලේඛනයක් කියවූවාට පසු, ඔහුට හෝ ඇයට ඒ ගැන කතා කිරීමට දිරිගන්වන්න.



ඔබේ ළමයාගේ රුචීන්ට ගැලපෙන අදහස් සමහරක් මෙහි දැක්වේ.

- කතුවරයා හෝ චිත්‍රණකරු ගැන ඔවුන්ගේම වෙබ් අඩවියට ගොස් කියවන්න.
- එම කතුවරයාගේම තවත් කතාවක් සොයා කියවන්න.
- ලේඛනයක ඇති උපදෙස් අනුගමනය කර යම්දෙයක් නිර්මාණය කරන්න, උදාහරණ ලෙස ආහාර පිළියෙළ කිරීමේ වට්ටෝරු, ආකෘති සෑදීම, කඩදාසි නැවීම (paper folding). ඔරිගාමි උත්සාහ කර බලන්න (origami ජපන් කඩදාසි නැවීම). උදාහරණ සහ උපදෙස් සඳහා මේ සබැඳිය බලන්න **http://www.origami.com/index.html**
- කතාවක ඇති චරිත හෝ දර්ශන ගැන පින්තූර අඳින්න නැතහොත් පාට කරන්න. මේවා ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ *Draw* සබැඳිය තෝරාගෙන මාර්ගගතව ඇඳීමට පුලුවන.
- එකම මාතෘකාවක් ගැන මත කීපයක් ලබා ගැනීම සඳහා එම මාතෘකාව ගැන ලිපි කිහිපයක් හඬලේ කියවන්න. ප්‍රකාශකර ඇති විවිධ මත සාකච්ඡා කරන්න.
- පොතක් පාදකව නිපැයූ චිත්‍රපටයක් නරඹා සංසන්දනය කරන්න.
- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ ඊමඅගඑස සබැඳිය තෝරාගෙන චරිතයක් හෝ පසුබිමක් සඳහා රූප තෝරන්න.

## ඔබේ ළමයාගෙන් ප්‍රශ්න ඇසීම

ප්‍රශ්න ඇසීමෙන් ඔබේ ළමයාට පහත දැක්වෙන අයුරු උපකාර කිරීමට ඔබට පුලුවන:

- ඔවුන් කියවීමෙන් සහ ලිවීමෙන් ලබන වින්දනය බෙදාහදා ගැනීම.
- චරිත හෝ මාතෘකා ගැන වඩා හොඳ අවබෝධයක් වර්ධනය කිරීම.
- අනුන් කෙරෙහි සහවේදනය වර්ධනය කිරීම.
- ලෝකය ගැන ඔවුන්ගේ ඇගයුම්, ආකල්ප සහ විශ්වාස වර්ධනය කිරීම.
- ලෝකය පිළිබඳව ඔවුන්ගේ අත්දැකීම සහ දැනුම පුළුල් කිරීම.
- ඔවුන්ගේ පරිකල්පණය පෝෂණය කිරීම.
- ඔවුන් කියවන දේවල වැදගත් කරුණු සලකා බැලීම.

ඔබේ ළමයාගෙන් පාසැලේදී මේ ආකාරයේ ප්‍රශ්න ඇසීමට ඉඩ ඇත. නිවසේදී කියවීම ගැන කතා කරනවිටද මින් සමහරක් ප්‍රශ්න ඇසීමට ඔබට පුලුවන.

- චරිතවල නම් මොනවාද?
- පසුබිම කුමක්ද?
- ඉන් පසු එම චරිතය කළේ කුමක්ද?
- ලේඛනයේ මුලදී/අගදී සිදුවුනේ කුමක්ද?
- ඔබ සිතන අයුරු එම චරිතයට මතුවූ හැඟීම් මොනවාද?
- ඔබ අවසානය වෙනස් කරන්නේ කවර අන්දමටද?
- චරිතයේ/පසුබිමේ වෙනස්වීම් ඔබ විස්තර කරන්නේ කෙසේද?
- ඔබ සිතන අන්දමට කතාවේ ප්‍රධාන පණිවුඩය කුමක්ද?
- ඔබට එය වෙනත් සිදුවීමක් හෝ මාතෘකාවක් සමග සම්බන්ධ කිරීමට පුලුවන්ද?
- කර්තෘගේ අදහස් සමග ඔබ එකඟ වෙන්නෙහිද?
- කතාවේ ප්‍රධාන පණිවුඩය ගැන ඔබේ මතය කුමක්ද?
- අනිකුත් පුද්ගලයන් මෙය වෙනස් ආකාරයෙන් දැකිය හැක්කේ කොහොමද?

## අමාරු වචන තේරුම් ගැනීම



ඔබේ ළමයාට දීර්ඝ හෝ නුපුරුදු වචන ලිවීම සඳහා කාලය සහ උපක්‍රම ලබාදීම වැදගත්ය.

ඔබේ ළමයා කියවන අතර තුර ඔහුට හෝ ඇයට යම් වචනයක් කීමට පෙර මෙම මතක් කිරීම් කරන්න:

- වචනයේ අරුත ගැන හෝඩුවාවල් වාක්‍යය තුල සොයා බලන්න.
- වචනය දෙස වඩාත් සමීපව බලන්න. ඔබ දන්නා වෙනත් වචනයකට එය පෙනුමෙන් සමානද?
- වචනය කුඩා කොටස් වලට කැඩීමට ඔබට පුලුවන්ද?
- එම වචනයට කලින් සහ ඊට පසුව තිබෙන වචන වලින් යම් උපකාරයක් ලැබේද?

ඔබේ ළමයා කියවන විට ඔහුට හෝ ඇයට වචනයක අක්ෂර වින්‍යාසය කියා දීමට පෙර මෙසේ අසා බලන්න:

- එය නිවැරදි සේ පෙනෙනවාද?

**එක් නිශ්චිත අරමුණක් ඇතිව යමක් කියවීමට,** ලිවීමට හෝ බැලීමට, ඔබේ ළමයාට උනන්දු කරවන්න. මේ ගැන අදහස් සමහරක්:

- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ ඵවඉඵත සබැඳිය තෝරාගෙන පොතක හෝ චිත්‍රපටයක විචාරයක් කියවන්න. ඉන්පසු ඔවුනට තමන්ගේ විචාරය ඊට එකතු කිරීමට පුලුවන.
- සූප ශාස්ත්‍ර පොතක් නිමැයුම පිණිස ආහාර පිළියෙළ කිරීමේ වට්ටෝරු කියවන්න, එකතු කරන්න, අත්හදා බලන්න, ලියන්න.
- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ ටෙනඩ සබැඳිය තෝරා ගෙන ලෝකය ගැන කරුණු සොයා දැනගන්න.
- පවුලේ උදවිය සහ මිතුරන් සමග එක්ව සංවාදයේ යෙදීම පිණිස ක්ෂණික පණිවුඩ (instant messaging) භාවිතා කරන්න.
- ඔබේ ළමයාට සිදුවීම් සහ හැඟීම් යනාදිය සටහන් කිරීම සඳහා දිනපොතක් ලබා දෙන්න.
- සුබ පැතුම් පත් නිර්මාණය කර එහි ලියන්න.
- ඔබ සහ ඔබේ ළමයා පිසීමට කැමති කෑමක වට්ටෝරුවකට අවශ්‍ය බඩු ලැයිස්තුව ලියන්න.



- වෙබ් කැමරාවක්, ඩිජිටල් කැමරාවක හෝ ජංගම දුරකථනයක චිත්‍රපට කාර්යය (movie function) පාවිච්චි කර ඔබේම විඩියෝවක් රූපගත කරන්න. ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ අටවඟ සබැඳිය තෝරාගෙන අනික් ළමුන් විසින් තනන ලද විඩියෝ නරඹන්න.
- විකියකට (Wiki) බැඳී කියවන්න, ඊට අදහස් එක් කරන්න.

## පවුල් ව්‍යපෘති

කියවීමේදී සහ ලිවීමේදී මුළු පවුලම සහභාගි කරගැනීමට අවස්ථාව යොදා ගන්න. ඇතුළත් කර ගත හැකි පවුල් ව්‍යපෘති සමහරක්:

- මිතුරන්ට හෝ පවුලේ සාමාජිකයන්ට ඊමේල් යැවීම
- මිතුරන් හා පවුලේ සාමාජිකයන් සමග සන්නිවේදනය සඳහා සමාජයීය ජාල අඩවි (social networking sites) භාවිතා කිරීම
- පොත් පෙළක් හවුලේ කියවීම



- අලුත් උපාංගයක් ක්‍රියා කරන ආකාරය දැනගැනීමට එහි උපදෙස් කියවීම.
- මාර්ගගත බ්ලොගයක (online blog) හෝ දෛනික සටහන් පොතක පවුලේ සිදුවීම් හෝ චාරිකා අත්දැකීම් වාර්තාගත කිරීම
- නාට්‍ය ලිවීම සහ ඒවා පවුලේ සාමාජිකයන් හා මිතුරන්ට රඟපා පෙන්වීම.
- හරස්පද ප්‍රහේලිකා, වචන ප්‍රහේලිකා, තේරවිලි (brain teasers) හවුලේ විසදීම සහ වචන ක්‍රීඩා (word games) දැනුම පිරික්සීමේ තරග (quizzes) වල හවුලේ යෙදීම
- පොත් සාප්පු සහ පුස්තකාලයන්හි හවුලේ පොත් පිරික්සීම
- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ ගඅකළ අ මඹවඉළ සබැඳිය තෝරාගෙන හවුලේ චිත්‍රපටයක් තැනීම.
- විනෝද ගමනක් යාමට සිතියමක් හෝ විස්තර පත්‍රිකාවක් අනුගමනය කිරීම, පොදු ප්‍රවාහන සේවා කාලසටහන් කියවීම සහ පොදු ස්ථානයන්හි තොරතුරු සංඥාපුවරු කියවීම.

## ප්‍රාන්ත අගමැතිගේ කියවීම් අභියෝගය (Premier's Reading Challenge)

ප්‍රාන්ත අගමැතිගේ කියවීමේ අභියෝගය වික්ටෝරියානු සිසුන්ට තම කියවීම වැඩිදියුනු කරගැනීමට මාහැඟි අවස්ථාවකි. නියමිත ඉලක්ක කරා යාම පිණිස සිසුන්ට පොත් 15ක් හෝ ඊට වැඩි ගණනක් කියවීමට උනන්දු කරවනු ලැබේ. පොත් වලට නම් සඳහා අදහස් ඉදිරිපත් කිරීමද මීට ඇතුලත්ය. ප්‍රාන්ත අගමැතිගේ කියවීමේ අභියෝගය ගැන මෙතැනින් පිරික්සා ගන්න **http://www.education.vic.gov.au/prc/default.htm**